# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

## ඇබෑර්තු

### තත්කාර්ය පදනම මත අභ්‍යන්තර විගණක (තාක්ෂණ) තනතුර සඳහා බඳවා ගැනීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉදිකිරීම් සහ තාක්‍ෂණික ව්‍යාපෘතීන්හි තාක්ෂණික සහ ඉංජිනේරු අංශ කේන්ද්‍රගත කර ගනිමින් අභ්‍යන්තර තාක්‍ෂණික විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකුගේ සේවාව ලබා ගැනීමට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව තීරණය කර ඇත.

මෙම පත්වීම 2020 නොවැම්බර් සිට තත්කාර්ය පදනම මත වසරක කාලසීමාවක් සඳහා වේ.

**01. විෂය පථය**

මෙම තනතුරේ විෂය පථයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඉදිකිරීම් සහ තාක්ෂණ ව්‍යාපෘති ඇතුළුව එහි බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගන්නා සේවා සඳහා අභ්‍යන්තර තාක්ෂණ විගණන සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ආවරණය වේ. එහි පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍රයේ ඇගයීම සහ නිසි ප්‍රමිතියක් සකස් කිරීම මෙන්ම නීති හා රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරනු ලබන්නේදැයි සොයා බැලීම සඳහා වූ කටයුතු පරීක්ෂා කිරීම ඇතුලත් වේ. මෙමගින් ප්‍රශස්ත වටිනාකම් සැලසුම් සහ අනුමත අයවැය තුල අපේක්ෂිත අවශ්‍යතාවයන් සහ අරමුණු වලට අනුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට වගබලා ගැනීම පිණිස ව්‍යාපෘතියේ පිරිවැය විගණනය සහ පිරිවැය අධීක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. එමෙන්ම මෙම විෂය පථයෙන් ලංසු ලියකියවිලි කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේදී සක්‍රීය සහභාගිත්වය ආවරණය වේ. එමෙන්ම කොන්ත්‍රාත්තුවේ සඳහන් කර ඇති පරිදි අදාළ පිරිවිතර සහ තාක්ෂණික විස්තර ප්‍රකාරව අනුකූලතාවය සහතික කිරීම පිණිස අමුද්‍රව්‍ය සහ උපකරණ ප්‍රසම්පාදනය පිළිබඳ විගණනය මෙන්ම අදාළ ක්‍රියාපටිපාටීන්ට අනුව අභ්‍යන්තර අනුකූලතාවය ඇගයීම පිණිස ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු වලට අදාළ විගණනය සිදු කිරීම අභ්‍යන්තර විගණකගෙන් (තාක්ෂණ) බලාපොරොත්තු වේ.

**02. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්**

ඔහු/ඇය රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ රාජ්‍ය ව්‍යාපෘතියක ඉංජිනේරුවකු ලෙස වසර 15 කට වඩා වැඩි සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් මගින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධිය සහිත වරලත් ඉංජිනේරුවරයෙකු හෝ ඒ හා සමාන අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහිත වෘත්තිකයකු වීම.

සහ

ඔහු/ඇයට මෙම පැවරුමට සමාන තාක්ෂණ හෝ ඉංජිනේරු විගණනය පිළිබඳ අවම වශයෙන් පැවරුම් දෙකක් සිදු කර පළපුරුද්ද තිබිය යුතුය.

**03. වැටුප** :- එක් මසකට රු.200,000.00 දීමනාවක් ගෙවනු ලැබේ. (සාකච්ඡා කර ගත හැක)

**04. බඳවා ගැනීමේ පටිපාටිය** :- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිපල මත

**05. අයදුම්පත්‍රය භාර ගන්නා අවසාන දිනය** :- 2020.09.25

**06. අයදුම්පත්‍රය එවිය යුතු ක්‍රමය**

පහත සඳහන් ජීවදත්ත ඇතුලත් අයදුම්පත්‍රය අදාළ ලේඛනවල පිටපත් සහිතව 2020 සැප්තැම්බර් 25 හෝ එදිනට පෙර කොළඹ 08, ඇල්විටිගල මාවත, අංක. 276, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "අභ්‍යන්තර විගණක තනතුර (තාක්ෂණ)" යනුවෙන් සඳහන් කරන්න.

1. සම්පූර්ණ නම :
2. මුලකුරු සමග නම :
3. ස්ත්‍රී, පුරුෂ භාවය :
4. උපන් දිනය : ජාතික හැඳුනුම්පත් අංකය :
5. වර්තමාන තනතුර :
6. ලිපිනය :
7. විද්‍යුත් තැපෑල :
8. දුරකතන අංක : ජංගම දු.ක. :
9. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් :
10. පළපුරුද්ද :
11. වෙනත් තොරතුරු :

දිනය : අයදුම්කරුගේ අත්සන :

අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ "අභ්‍යන්තර විගණක (තාක්‍ෂණ) තනතුර" ලෙස සඳහන් කළ යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**